LIBRARY OF PARLIAMENT
15 NOV 1984
SRI JAYEWARDENEPURA KOTTE

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 11 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 මාර්තු මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 මාර්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ : ශත 35 යි තැපැල් ගාස්තුව : ශත 50 යි

1983 අංක 11 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1983 මාර්තු මස 14 වන දින.]

එල්. ඩී.—ඕ. 61/82.

ගුවන් සංතරණ පනත සහ 1982 අංක 2 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 11 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. ගුවන් සංතරණ පනතේ (1982 අංක 2 දරන පනත මගින් ප්‍රතියෝජිත) 23 වන වගන්තිය, එහි (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 365 වන අධිකාරයේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (3) අනුයෝජිතයා විසින් ආණ්ඩුව වෙනුවෙන් එකතු කර ගන්නා ලද හෝ අය කර ගන්නා ලද ගාස්තු, බදු හෝ අය කිරීම් වලින්—

(අ) ඔහු විසින් තම කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා සලසන ලද සේවා වන් සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන්නා වූ ගාස්තු; සහ

(ආ) ආණ්ඩුව වෙනුවෙන් ගගන යාත්‍රාංගන හෝ ගුවන් තොටුපළ වල් හෝ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය වන්නා වූ ද මුදල් විෂයය භාර අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද, ගුවන් යානා ගොඩ බැස්සවීම, භාවිත කිරීම හෝ නවත්වා තැබීම සම්බන්ධයෙන් ආණ්ඩුව වෙනුවෙන් ඔහු විසින් අය කර ගන්නා ලද ගාස්තු හෝ අය කිරීම් නොඉක්මවන්නා වූ ද වෙනත් මුදල් ප්‍රමාණයක් ඔහු වෙත තබාගත යුතුය. ".

3. 1982 අංක 2 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය එම වගන්තියේ (අ) සහ (ආ) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1982 අංක 2 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (අ) (i) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදී ගුවන් තොටු පළවල් පිළිබඳ අධිකාරිය සන්තකයේ සහ එහි පාලනය යටතේ පැවති සියලු නිශ්චල දේපළ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඔහු සතු වන්නේය ;

(ii) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදී ගුවන් තොටු පළවල් පිළිබඳ අධිකාරියට හිමිව හෝ එහි සන්තක යේ හෝ එහි පාලනය යටතේ පැවති මුදල් ඇතුළු සියලු චංචල දේපළ, ගුවන් සංතරණ පනතේ 21අ වගන්තිය යටතේ පත් කරන ලද අනුයෝජිතයා වෙත පැවරී ඔහු සතු වන්නේය ;

2—ඒ 68169—13,300 (83/03)

(ආ) (i) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවතියා වූ ද ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරියේ ගිවිසුම්වලින් හා බැඳීම්වලින් උද්ගත වන්නා වූ ද සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද සහ මුක්ති ගුවන් සංතරණ පනතේ 21අ වගන්තිය යටතේ පත් කරන ලද අනුයෝජිතයා සතු අයිතිවාසිකම්, වරප්‍රසාද සහ මුක්ති ලෙස සලකනු ලැබිය යුතුය ;

(ii) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ පැවතියා වූ සහ නියමිත දිනයට පෙර ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය විසින් දරනු ලැබූ සියලු ණය, බැඳීම් සහ වගකීම් ද ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය විසින් හෝ සමග ලියා අත්සන් කරන ලද හෝ එළඹුණු සියලු ගිවිසුම්, ඔප්පු, එකඟවීම් හා වෙනත් සාධන පත්‍ර ද, ඉටු කිරීමට ගිවිසගත් සියලු කාරණා හෝ දේවල් ද ගුවන් සංතරණ පනතේ 21අ වගන්තිය යටතේ පත් කරන ලද අනුයෝජිතයා විසින් හෝ සමග, අවස්ථාවෝචිත පරිදි, දරන ලද, ලියා අත්සන් කරන ලද, එළඹුණු හෝ ගිවිසගත් ලෙස සලකනු ලැබිය යුතුය. ”.